ආයතනයේ නම:- වාරිමාර්ග අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලැබූ පියවර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் :- நீர்ப்பாசன அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்துக்கு சமர்ப்பித்தல்.

Name of the institution:- Ministry of Irrigation

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of standing order No 119(4)

ආකෘතිපත්‍ර (අංක 1)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක :- 183

ආයතනයේ නම :- වාරිමාර්ග අමාත්‍යාංශය

	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
1.	වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මේ වන විට වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු මුරපදය ප්‍රධාන ගණකාධිකාරී විසින් පමණක් භාවිතා කරනු ලබයි
2.	වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මේ වන විට අදාල මුරපද තුන්මසකට වරක් වෙනස් කරනු ලබයි.
3.	විගණකාධිපති විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශය යටතේ, ආයතන හා රට පුරා ව්‍යාප්තව පවතින ව්‍යාපෘති ගණනාවක් පවතින අතර එම ආයතන හා ව්‍යාපෘති සඳහා නිකුත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කිරීමේදී එම ආයතන/ ව්‍යාපෘතිවලින් තොරතුරු ගෙන්වා ගත යුතු වේ. එහිදි යම් කාලයක් ගත වන බැවින් ඇතැම් විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වේ. එවැනි අවස්ථාවලදී පිළිතුරු සැපයීම සඳහා ලබා දෙනු ලබන කාලය දීර්ඝ කර ගැනීම සඳහා සහකාර විගණකාධිපති/ විගණන අධිකාරිගේ අනුමැතිය ලබා ගනු ලැබේ.
4.	මු.රෙ.134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට අභ්‍යන්තර විගනණ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යොමු කරනු ලැබේ.
5.	2017.06.26 දිනැති 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම.	මේ වන විට මිලදී ගනු ලබන වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබයි.
6.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබීම.	ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.
7.	මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබීම.	කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය අත්‍යාවශ්‍ය විදුලිය, ජලය පවිත්‍ර ආරක්ෂක වැනි සේවාවන් සඳහා ගෙවීම් කිරීමට වාර්ෂිකව වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුකොටගෙන අනුමත සීමාවන්

		ඉක්මවා බැඳීම් ඇති කර ගැනීමට සිදු වී ඇති අතර හැකි තාක් දුරට අනුමත වාර්ෂික ඇස්තමේන්තු තුල වියදම් කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද හදුන්වා දී ඇත
8.	**වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහ ණය ශේෂ පැවතීම.**	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු. 661,642 වන නිහතිටි ණය ශේෂයෙන් මේ වන විට රු. 345,470ක මුදලක් නිරවුල් කර ඇත. ඉතිරි රු. 316,172 වන ණය මුදල මෙම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත වාරිමාර්ග කළමනාකරණ අංශයේ සේවය හැර ගිය හා මියගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂයන් වේ. මේ වන විටත් එම මුදල් අය කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී
9.	**පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළිවෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.**	වාරිමාර්ග අමාත්‍යාංශය සෘජුව බාහිර සේවාලාභීන්/පාරිභෝගිකයන් වෙත සේවා හා පහසුකම් සපයන ආයතනයක් නොවන බැවින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සැකසීම පිළිබඳව වැඩිමනත් අවධානය යොමු කර නොතිබුණි. මෙම අමාත්‍යාංශයෙහි ප්‍රධාන කාර්යයන් වනුයේ, I. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා ආයතන වල කාර්යයන්ට අදාළ ප්‍රතිපත්ති සැකසීම සහ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බවට තහවුරු කරගනිමින් ජල සම්පත් හා වාරිමාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම. II. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග කළමනාකරණය හා නඩත්තුව III. ජල සම්පත හා වාරිමාර්ග පද්ධති ආරක්ෂා කිරීම හා සංරක්ෂණය ආදිය වේ. කෙසේ නුමුදු අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතනවල සේවයේ නියුතු අභ්‍යන්තර කාර්යය මණ්ඩලයට සේවා සැපයීමට අදාළව අභ්‍යන්තර සේවා ලාභී නිර්ණායකයන් සංවර්ධනය කර නිබෙ. උදාහරණය ලෙස, I. අමාත්‍යාංශයේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ නිලධරයෙකුගේ සේවය ස්ථිර කිරීම්/ උසස් කිරීම් වලය අදාළ ඉල්ලීම් රාජකාරී දින දෙකක් හෝ තුනක් ඇතුලත සම්පූර්ණ කර අවසන් කිරීම හෝ අදාළ ආයතන වෙත යොමු කිරීම.

		II.	යම් ව්‍යාපෘති (වැඩසටහන්) සම්බන්ධව ලැබෙන මහජන පැමිණිලි වලට අදාළව වැඩ කරන දින 07 හා 10 අතර, අතුරු පිළිතුරු ලබා දීම. එනමුත් අදාළ ආයතන වෙතින් තොරතුරු ලබාදීමට ගන්නා කාලය අනුව අවසාන පිළිතුර ලබාදීමට ගන්නා කාලය වෙනස් වේ.
		III.	තොරතුරු දැනගැනීමේ පනතෙහි විධිවිධානුකූලව කටයුතු කිරීම.
		IV.	මෙම අභ්‍යන්තර සේවාලාභීන්ට අදාළ ප්‍රඥප්තිය තවදුරටත් සංවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.
10.	රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙළ කර නොතිබීම. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබීම.	I.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානුකූලව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමෙහි ප්‍රායෝගික අපහසුතා පැවතුණු අතර, 2020-2022 වකවානුව තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා හා ප්‍රතිපාදන සීමාවන් නිසා ලබාදෙන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ඉතා සීමිත විය.
		II.	එම කාල සීමාවන්හිදී ද මාර්ගගත ක්‍රමය ඔස්සේ විවිධ රාජ්‍ය ආයතන මඟින් පවත්වනු ලැබූ මාර්ගගත පුහුණු වැඩසටහන් සඳහා කාර්යය මණ්ඩලය සම්බන්ධ කරවන ලදී. (උදා:- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලැබූ වැඩසටහන්)
		III.	එබැවින් මානව සම්පත් සංවර්ධන සැලසුමෙහි සඳහන් පරිදි නොවුනද බොහෝ සේවකයන්ට හුට පුහුණු අවස්ථා / හැකියා සංවර්ධන අවස්ථා ලබා දී ඇත.
		IV.	කාර්යය මණ්ඩලයෙහි සියලු මාණ්ඩලික නිලධාරීන් වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් ගතව ඇති අතර, අනෙකුත් කාර්යය මණ්ඩලය සඳහා කාර්යය සාධන ඇගයුම් ක්‍රමවේද ක්‍රියාත්මක වේ.
		•	ආයතනික මානව සම්පත් සංවර්ධන කටයුතු හා ධාරිතා සහ නිපුණතා සංවර්ධන කටයුතු පාලන අංශය මඟින් සිදුවේ. එම අංශය භාර අතිරේක ලේකම්වරයා විසින් එම කාර්යයන් සඳහා වගකීම දරණ ජ්‍යෙෂ්ඨ නිලධාරියා වේ.

		• මීට පෙරද පැහැදිලි කළ පරිදි 2020, 2021 යන වර්ෂයන් කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන්ද 2022 වර්ෂයේ පැවති බලශක්ති අර්බුධකාරී තත්ත්වය යටතේ විටින් විට ආයතනය වැඩමුර ක්‍රමයට (Work Rotation) ලෙස ක්‍රියාත්මක වූ අතර, එවැනි විශේෂ අවස්ථාවලදී පුහුණු වැඩසටහන් ආදිය සැලසුම්ගත පරිදිම ක්‍රියාත්මක කිරීමට හැකිවන ප්‍රායෝගික තත්ත්වයක් නොපැවතුණි.

රොෂාන් රණසිංහ
වාරිමාර්ග අමාත්‍ය

වාරිමාර්ග අමාත්‍යාංශය
අංක 500
ටී.බී.ජයා මාවත
කොළඹ 10

2023.06.15